# අබ්‍රහ්මචාරී ව බ්‍රහ්මචාරී යැයි කියන්නාත් බ්‍රහ්මචාරීන්ට අබ්‍රහ්මචාරීයි චෝදනා කරන්නාත් කාමයේ දෝෂ නැතැයි දැක්මෙන් කාමය පරිභෝග කරන්නාත් මරණින් මතු අපායෙහි උපදියි

## අපායික වර්ගය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 1- පිටු අංක 474 - 475)

පාප ධර්ම තුනක් අත් නොහැර මොවුහු තිදෙනෙක් අපායගාමී වෙති. නිරයගාමී වෙති.

කවර තිදෙනෙක් ද යත්,

1. යම් කෙනෙක්, අබ්‍රහ්මචාරී වූයේ බ්‍රහ්මචාරී ප්‍රතිඥා ඇත්තේ (බ්‍රහ්මචාරී යැයි කියන්නේ) වෙයි.
2. යම් කෙනෙක්, පිරිසිදු බ්‍රහ්මචරියාවේ හැසිරෙන්නෙකුට අමූලක (හේතු/කරුණු නැති) වූ අබ්‍රහ්මචරියා වාදයෙන් නින්දා, චෝදනා කරන්නේ වෙයි.
3. යම් කෙනෙක්, කාමයන්හි දෝෂයෙක් නැතැයි මෙබඳු වාද ඇති ව මෙබඳු දෘෂ්ටි ඇති ව කාමය පරිභෝග කරන්නේ වෙයි.

මේ පාප ධර්ම තුන අත් නොහැර සිටින මොවුහු තිදෙනා අපායගාමී වෙති.